**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2022**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ("අධිකාරිය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කලයුතු වුවත් අධිකාරියේ රු.820,826 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශනයේ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව අදාළ ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කල යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය අනුව පූර්ව කාල පරිච්ඡේද වැරදි සොයා ගැනීමෙන් පසුව, නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්ධනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් ඒවා අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුව ද (Re -State), රු.1,691,149 ක් වූ පෙර වර්ෂයට අදාළ ගැලපුම් ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයට ගලපා තිබුණි. | 2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී ගැලපීම් කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව වැරදි නිවැරදි කිරීම් සම්බන්ධ නිරූපනයන් මූල්‍ය ප්‍රකාශවල කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්තා කරන කාලපරිච්ඡේදයක් අවසානයේ දී සමාලෝචනය කර අදාළ වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු වුවද, අධිකාරියේ ක්ෂය කර අවසන් ව ඇති නමුත් භාවිතා කරන මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 05 යටතේ දක්වා තිබූ එකතුව රු. 6,052,525 ක් වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතියට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ප්‍රමිත අංක 7 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර වටිනාකම් ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ | ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව වත්කම් ක්ෂය සම්බන්ධව කටයුතු කල යුතු වන බව. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි 44 ඡේදය අනුව "වත්කමක් ලෙස හඳුනා ගත් හුවමාරු නොවන ගණුදෙනුවකින් වන සම්පත් ගලා ඒමක් අයභාරයක් ලෙස හඳුනාගත යුතු වුවත් 2017 හා 2021 වර්ෂවල අමාත්‍යාංශයෙන් අධිකාරියට ලැබී තිබූ ස්ථාවර වත්කම්වල වටිනාකම වූ රු.1,888,677 ක් ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි. එම වත්කම් වටිනාකම ජංගම නොවන වගකීමක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ අතර පෙර වර්ෂ ගැලපුමක් ලෙස සටහන් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කරනු ලැබේ | ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව ප්‍රදාන සම්බන්ධව කටයුතු කල යුතු වන බව. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ, සේවක ණය හා ලැබිය යුතු ශේෂ එකතුව රු.2,889,460 ක අඩු වීම, කාරක ප්‍රාග්ධන වෙනස් වීම් ලෙස නොසලකා එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මෙය ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයේ පොලී ලැබීම් තුල ගැලපීම් සිදු කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කල යුතු බව. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | කෙටිකාලීන ආයෝජන | 4,483,154 | ශේෂ සනාථන | ශේෂයන් සනාථ කිරීම සඳහා ලිපි යවා ඇත. | ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ණය හිමි ශේෂ | 294,689 | ශේෂ සනාථන | ශේෂයන් සනාථ කිරීම සඳහා ලිපි යවා ඇත. | ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ලැබිය යුතු ශේෂ | 387,981 | ශේෂ සනාථන | ශේෂයන් සනාථ කිරීම සඳහා ලිපි යවා ඇත. | ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ විෂය පථයට අයත් නොවූ කාර්යයක් වූ ගම්පහ සහ මීගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් යොදවා ඇති සේවකයන්ගේ වැටුප් හා සේවා ගාස්තු ප්‍රතිපූර්ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.8,285,287 ක ශේෂයෙන් රු.5,940,770 ක ශේෂයක් 2018 වර්ෂයේ සිට නඩත්තු කටයුතු නවතා ඇති මීගමුව රෝහලින් අයවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 5 වැඩි කාලයක් ගත වී ඇතත් එය නිරවුල් කරගෙන නොතිබුණි. | මීගමුව රෝහලෙන් ලැබිය යුතු රු. මිලියන 5.94 හිගමුදල ලබාගැනීමට සෞඛ්‍ය සේවා අමාත්‍යංශ සමග පැවැත් වූ රැස්වීමට අනුව කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තාව අනුව හිග මුදල් ගෙවීමට එකග වී ඇත. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.3,971,005 ක් වූ ලැබිය යුතු ශේෂය තුල මාදිවෙල පාර්ලිමේන්තු නිවාස සංකීර්ණයේ නඩත්තු කටයුතු සඳහා පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු රු.882,922 ක්ද , සභාධිපත්‍ය දේපල 159 කින් සමතකරණ ගාස්තු රු. | සමතකරණ ණයගැති ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇති බැවින් පොත්වලින් ඉවත් කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට සාමාන්‍යාධිකාරී (නීති) ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. එම | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | |
|---|---|
| 2,668,305 ක් හා ජල්තර රජයේ සේවක නිවාස සංකීර්ණයේ නිවැසියන් 53 ගෙන් අයවිය යුතු රු. 419,775 ක්ද පැවතුණි. මෙම ණයගැති ශේෂය තුල වර්ෂ 05 ට වැඩි කාලයක සිට අයනොවී පවතින ලැබිය යුතු ශේෂ එකතුව රු.3,088,083 ක් වී තිබුණි. | කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 | වැඩබැලීමේ පත් කිරීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස පමණක් වුවද, අධිකාරියේ නිලධාරීන් 03 දෙනෙකු වසර 2 කට වැඩි කාලයක් වැඩබැලීමේ කටයුතු සිදු කරමින් පැවතුණි | මෙම ආයතනයේ පුරප්පාඩු පිළිබඳව 2023 මාර්තු 10 දිනැති ලිපියෙන් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ මාර්ගෝපදේශවල 6.2 (ඇ) ඡේදය | රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු.544,601,929 ක ස්ථාවර තැන්පතු 05 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්ථාවර තැන්පතු වල ආයෝජනයට අනුමැතිය ඉල්ලා රේඛීය අමාත්‍යාංශ ලේකම් මගින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත 2023 මාර්තු 16 ලිපියක් යොමු කර ඇත. | චක්‍රලේඛයේ උපදෙස් අනුව ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ)<br>(i) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත 3 පරිච්ඡේදයේ 3.2 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කළ ආයතනයේ ක්‍රමෝපායික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව සේවක කාර්ය සාධනය මැනීම සඳහා පිළියෙල කරන ලද ක්‍රමවේදයන් මගින් සහතික විය යුතු වුවත් අධිකාරිය කිසිදු ඇගයීම් ක්‍රමවේදයකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 7,517,703 ක දිරිදීමනා ගෙවීම් කර තිබුණි. | 2022 පිළියෙල කල සේවක කාර්යසාධනය මැනීම සඳහා ආංශික කාර්යය දර්ශකයන් වල කෙටුම්පත නිවාස අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත | චක්‍රලේඛ උපදෙස් අනුව කාර්යසාධනය ඇගයීමට ලක් කල යුතු බව. |
| (ii) | 5 පරිච්ඡේදයේ 1 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කළ ආයතනයේ ක්‍රමෝපායික සැලැස්ම සකස් කිරීමේ දී ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ දර්ශක හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ දී ඒ සඳහා උපදේශාත්මක සේවාවක් ලබා ගෙන විධිමත් ආංශික කාර්යය දර්ශකයන් පිළියෙළ කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් අනුව කාර්යසාධන දර්ශක හඳුනාගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | 1978 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ 5 (2) | 2010 සිට 2022 වර්ෂය දක්වා අර්ධ හෝ තාවකාලික සහධිපත්‍ය සහතික ලබාගෙන තිබූ සහධිපත්‍ය දේපළ70 ක් සඳහා පළාත් පාලන ආයතනවලින් අනුකූලතා සහතික ලබා ගෙන නොතිබූ නිසා අවසාන සහධිපත්‍ය සහතික ලබා දී නොතිබුණි. මේ අතර අර්ධ හෝ තාවකාලික සහතික ලබා ගෙන වසර 3 ක් ගත වූ දේපළ | 2010 – 2022 දක්වා අවසන් සහතික ලබා නොගෙන ඇති දේපල 70 ක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කෙරේ. වසර අග වන විට සහාධිපත්‍ය සහතික ලබා ගනී යැයි අපේක්ෂා කෙරේ | සහාධිපත්‍ය සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් පනතේ නීතිරීති වලට අනුකූලව කටයුතු කල යුතු බව. |

54 ක් විය. අනුකූලතා සහතිකයක් නොමැතිව සහාධිපත්‍ය දේපලේ පදිංචි විය නොහැකි වුවත් ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමක් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ බදු පෙර අතිරික්තය රු.131,259,446 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදු පෙර අතිරික්තය රු.206,261,702 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.75,005,256 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම රු.154,280,446 කින් පහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ආදායම 2021 වර්ෂයට සාපේක්ෂව රු.154,280,446 ක් හෙවත් සියයට 45 කින් අඩු වී තිබුණි. මේ සඳහා ඉදිකර අවසන් කර ඇති දේපල සඳහා නිකුත් කරන ලද සහතික ආදායම රු.138,089,972 කින් එනම්, සියයට 56 කින් හා සහධිපත්‍ය සහතික (මූලික නිශ්කාෂන) නිකුත් කිරීමේ ආදායම රු.52,853,747කින් එනම්, සියයට 101 කින් පහල යාම හේතු වී තිබුණි.

(ආ) ඍජු වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු.1,908,287 කින් ඉහළ ගොස් තිබුණි. මේ සඳහා සහාධිපත්‍ය සහතික නිකුත් කිරීමේ වියදම රු.487,663 ක් හා සමතකරණ ගාස්තු රු.1,281,594 කින් වැඩි වීම බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 ජූලි 05 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව සහාධිපත්‍ය දේපල සංවර්ධනය සඳහා ලබාදෙන මූලික නිශ්‍යකාශන ලිපියක වලංගු කාලය වසර 03 ක් පමණක් වුවද 2011 වර්ෂයේ සිට 2022 දක්වා කාලය තුල අර්ධ හෝ තාවකාලික සහාධිපත්‍ය සහතික ලබා ගෙන තිබූ දේපල 71 ක් සඳහා අවසන් සහාධිපත්‍ය කළමනාකරණ සහතික ලබා ගෙන නොතිබුණි. | මූලික නිශ්කාෂණ ලිපිය අළුත්කර අවසාන සහතික නිකුත් කිරීමට 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ. | ලිපිවල වලංගු කාලය තුළ සහතික පත්‍ර නිකුත් කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. |
| (ආ) | සහාධිපත්‍ය දේපල සම්බන්ධයෙන් අධිකාරිය වෙත 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලි 87 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. මෙම පැමිණිලි අතර, අනවසර ඉදිකිරීම් | අධිකාරියට ලැබුණු පැමිණිලි 87 න් 28 ක් 2023 අප්‍රේල් වන විට විසඳා ඇත. ඉතිරි ඒවා විවිධ හේතූන් මත විසඳුම් ලබා දි නොමැත | සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි කඩිනමින් විසඳිමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් පැමිණිලි 27 ක් ද, ජල කාන්දු වීම් සම්බන්ධ පැමිණිලි 22 ක් වූ අතර එයින් 10 ක් ලැබී වසර 2 - 4 ත් අතර කාලයක් ගත වී තිබීම හේතුවෙන් දේපල හා ජීවිතවලට අනතුරුදායක තත්වයකට පත්විය හැකි බව නිරීක්ෂණය විය. මෙයින් පැමිණිලි 4 ක් ලැබී වසර 5 කට වැඩි කාලයක් ද, පැමිණිලි 39 ක් ලැබී වසර 3 කට වැඩි කාලයක් ද, පැමිණිලි 19 ක් ලැබී වසර එකට වැඩි කාලයක් ද ගත වී තිබුණි. තව ද දේපල, පිඹුරු ලියාපදිංචි නොකිරීම් සම්බන්ධ පැමිණිලි 15 ක් ද විය. ඊට අමතරව අධිකාරිය විසින් විභාග කර තිබූ අනවසර ඉදිකිරීම් සම්බන්ධ පැමිණිලි 5 ක් සඳහා නියෝග නිකුත් කර තිබුණ ද, එම නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. අධිකාරියට පැමිණිල්ලක් ලැබුණු පසු පැමිණිලිකරුට සහ වගඋත්තරකරු වෙත සහාධිපත්‍ය පනතේ 9 අ (1) වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කළ යුතු වුවත්, ලැබුණු පැමිණිලි 9 සම්බන්ධයෙන් දැන්වීම නිකුත් කිරීමට මාස 3 ත් වසර 3 ත් අතර කාලයක් ගත කර තිබුණි. | | |
| (ඇ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 (ඉ) අනුව සහධිපත්‍ය දේපළ සඳහා පිහිටවනු ලබන කළමනාකරණ සංස්ථාවල කටයුතු කළමනාකරණය කිරීම හා පාලනය කිරීම අධිකාරිය විසින් සිදු කළ යුතු වේ. මේ අනුව අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ සංස්ථා 978 ක් ස්ථාපිත කර තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විට එයින් 457 ක් අක්‍රියව පැවතුණි. මේ අනුව අධිකාරිය විසින් කළමනාකරණ සංස්ථා නිසි පරිදි නියාමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | රටේ පැවති ආර්ථික හා දේශපාලන අර්බුධ නිසා 2022 වර්ෂයේ සැප්තැම්බර් දක්වා රැස්වීම් පැවැත්වීමට නොහැකි විය . | පනතේ විධිවිධාන අනුව කළමනාකරණ සංස්ථා සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | 1977 වර්ෂයේ සිට අධිකාරි කාර්යාලය පවත්වාගෙන යන නමුත් ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමග බදු ගිවිසුමකට එළඹ නොතිබුණි. කෙසේ වුවද වාර්ෂික බදුකුලිය 2021 වර්ෂයේ සිට රු. 4,848,660 සිට රු.8,400,000 දක්වා වැඩි කර තිබූ බව නිරීක්ෂණය විය. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමග එකගතාවයකට පැමිණ බදු ගිවිසුම් අත්සන් කරනු ලැබේ . | විධිමත් කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සහධිපත්‍ය දේපල නීතිය යටතේ වූ 1982 අංක 45 දරන බද්ධ නිවාස (සංශෝධන) පනතේ වූ ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛන 3 (2) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සංස්ථාවල වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්විය යුතු අතර, එහි 8 (4) (අ) අනුව කළමනාකරණ සංස්ථාවේ විගණනය කළ වාර්ෂික ගිණුම් වාර්තාවල පිටපතක් අධිකාරියට ඉදිරිපත් කළ යුතු වේ. එහෙත් 2022 වර්ෂය සඳහා සංස්ථා 269 ක වාර්ෂික රැස්වීම් පවත්වා විගණනය කළ වාර්ෂික වාර්තා අධිකාරියට ඉදිරිපත් කර නොතිබුණි. | රටේ පැවති ආර්ථික දේශපාලන අර්බුධ නිසා මහාසභා රැස්වීම් නොපැවැත්වූ බැවින් අදාල වර්ෂය සඳහා විගණන වාර්තා අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හෝ ලබා දීමට අපොහොසත් වී ඇත. | කළමනාකරණ සංස්ථාවල වාර්ෂික ගිණුම් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | එඩ්මන් එඩ්මන්ට්න් රජයේ සේවක නිවාස සංකීර්ණයේ නඩත්තු අරමුදල වන රු.6,800,000 ක් එම නිවාස සංකීර්ණයේ සහධිපත්‍ය පිඹුර ලියාපදිංචි කර නීත්‍යානුකුල කළමනාකරණ සංස්ථාව පිහිටුවන තෙක් දෙපාර්ශවයේ එකඟතාවය මත 2011 වර්ෂයේ දී ඒකාබද්ධ ගිණුමක තැන්පත් කර තිබුණි. මෙහිදී නීත්‍යානුකුල කළමනාකරණ සංස්ථාව පිහිටු වීමෙන් පසු මුදල් පරිපාලනය පිළිබඳ සම්පූර්ණ වගකීම කළමනාකරණ සංස්ථාවට පවරා අධිකාරිය ඒකාබද්ධ ගිණුමෙන් ඉවත් වීමට එකඟ වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 11 ක් ඉක්මවා ගොස් තිබුණ ද, නීත්‍යානුකුල කළමනාකරණ සංස්ථාව පිහිටු වීමට කටයුතු කර නොතිබුණි. | සහාධිපත්‍ය දේපල අංක 306 හා 308 පිඹුරු 2 මගින් ලියාපදිංචි කර ඔප්පු නිකුත් කරමින් පවතින බව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති අතර ඉදිරියේදී නීත්‍යානුකුල කළමනාකරණ සංස්ථා පිහිටුවනු ලැබේ.. | කඩිනමින් කළමනාකරණ සංස්ථාව පිහිටුවිය යුතුය. |
| (උ) | සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනත සංශෝධනයට අදාළ ක්‍රියාකාරකම් 5 ක් 2022 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර තිබු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි.එබැවින් ගෝලීය ප්‍රවණතා පාදක කර ගනිමින් සිදු කරනු ලබන මිශ්‍ර සහාධිපත්‍ය ඉදිකිරීම් සඳහා පවතින පනතේ ප්‍රතිපාදන අදාළ කරගත නොහැකි වී තිබුණි. | පහත සංශෝධනයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශ ලේකම්ට යවා ඇති අතර අනුමැතිය ලද පසු සංශෝධනය කරනු ලැබේ. | පනතේ අවශ්‍ය සංශෝධන කඩිනමින් සිදු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය වියදම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

අධිකාරියේ සාමාන්‍යාධිකාරි තනතුර පුවත්පත් දැන්වීම් පළකර 2022 බඳවා ගැනීමේ පරිපාටිය සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට පෙබරවාරි 10 හා 2022 අනුව අධිකාරියට සුදුසු 2021 දෙසැම්බර් 12 දින සහ 2021 නොවැම්බර් 19 දිනයන්හි සමනායධිකාරවරයෙකු බඳවා

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දින පුවත්පත් දැන්වීම් පලකිරීමට රු.මිලියන 1.65 ක් වැය කර තිබුණි. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබූ නමුත් බඳවා ගැනීමක් සිදු කර නොතිබුණි. 2022 ජනවාරි 01 සිට ජූනි 30 දක්වා වැඩබැලීමේ නිලධාරියෙකු පත් කර තිබූ නමුත් ඉන්පසු සාමාන්‍යාධිකාරිවරයකු නොමැති බැවින් මාස 06 වැඩි කාලයක් පනතේ 16 වගන්තියේ සඳහන් පරිදි ප්‍රධාන විධායක කාර්ය භාරය ඉටු නොවී පැවතුණි. 2023 ජනවාරි 20 දින නැවත වැඩබැලීමේ පත් වීමක් සිදු කර තිබූ අතර, නිත්‍ය පත්වීමක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව ඉහත පුවත්පත් දැන්වීම් සඳහා වැය කළ මුදල ද නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. එහෙත් අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු තෝරා පත්කර ගැනීමට අපොහොසත්ව ඇත. | ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ආයතන 3 කින් මිල ගණන් ලබා ගෙන රු.1,209,436 ක ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර, ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර නොතිබුණි . ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් ද රු.591,105 ක ලිපිද්‍රව්‍ය ද මිලදී ගෙන තිබුණු අතර ලියාපදිංචි සැපයුම්කරුවන් 27 සිටියදී පරිගණක උපකරණ මිලදී ගැනීම සඳහා රු.114,264 වැය කර පුවත්පත් දැන්වීමක් පල කර තිබුණි. | 2021 ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ අවම මිල ගණන් අනුව මිලදී ගෙන ඇත. අධිකාරියේ එදිනෙදා රාජකාරි සඳහා අත්‍යාවශ්‍ය ලිපිද්‍රව්‍ය 2021 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 21/1118/313/036 අනුව තනි මිල කැඳවුමක් මත ශ්‍රී ලංකා රජයේ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීම සිදුකරන ලදී. එවකට සිටි වැඩබලන සාමාන්‍යාධිකාරී විසින් මෘදුකාංග පිරිවැය වෙනම සඳහන් කර නැවත මිල ගණන් කැඳවන ලෙස උපදෙස් දුන් බැවින් නැවත මිල ගණන් කැඳවීමට රු.114,264 වැය කර පුවත්පත් දැන්වීම් 04 ක් පළකරන ලදී. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අධිකාරියේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 138 හා 106 ක් ද පුරප්පාඩු 32 ක් ද වූ | මෙම පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීම් ක්‍රියාවලි සමාලෝචනය කිරීමට පත් | අත්‍යාවශ්‍යම වන තනතුරු පිරවීමට කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| අතර එ තුළ මාණ්ඩලික තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි. ඉහත මාණ්ඩලික තනතුරු 07 ක් 2010 වර්ෂයේ සිටම පුරප්පාඩුව පැවතුණි. | කරන ලද කමිටුවේ අනුමැතිය ලබාගැනීමට 2023 මාර්තු 10 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත. | |

**3.5 වාහන පද්ධති කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 මැයි 12 දින අංක KU – 1233 දරණ වාහනයට සිදු වූ වාහන අනතුරක් හේතුවෙන් එන්ජිමේ අළුත්වැඩියාවන් සඳහා අධිකාරිය රු.373,060 ක් වැය කර තිබුණි. හානිය සඳහා රක්ෂණ වන්දිය ලෙස රු.67,125 ක් පමණක් ලැබී තිබූ අතර, මු.රෙ.104 පරීක්ෂණය අනුව රථයේ රියදුරු වැරදිකරු ලෙස නම් කර තිබූ නමුත් මු.රෙ.104(4) අනුව පූර්ණ වාර්තාවක් ලබා ගෙන නොතිබූ අතර, අනතුරින් මාස 22 ක් ගත වී ඇතත් අධිකාරිය සිදු වූ අලාභය ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | විධිමත් විනය පරීක්ෂණයෙන් රියදුරු සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කර ඇත. එම තීරණය හා අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇති බැවින් අලාභය ප්‍රතිපූර්ණය කරගත නොහැකි තත්වයක් පවතී. | මු.රෙ. 104 (4) අනුව පූර්ණ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කල යුතුය |
| (ආ) | අධිකාරිය සතු වාහනයක් 2019 දෙසැම්බර් 19 අනතුරුවලට භාජනය වී තිබූ අතර, එම අනතුරු හේතුවෙන් සිදු කළ යුතු අළුත්වැඩියාවන් වසර 3 ක් ගත වී ඇතත් සිදු කර නොමැති අතර, ඇස්තමේන්තුගත අළුත්වැඩියා වියදම වූ රු.2,559,571 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රක්ෂණ ආවරණයෙන් රු. ලක්ෂ 05 ක් පමණක් ලබා ගැනීමට හැකියාව ඇති අතර ඉතිරිය අනෙක් පාර්ශවයෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | වාහනය අළුත්වැඩියා කිරීමට සහ වගකිවයුතු පාර්ශවයන්ගෙන් වන්දි ලබා ගැනීමට කටයුතු කල යුතු බව. |